Amãna Bank

## කාලීන ආයෝජන ගිණුම්

අප කාලීන ආයෝජන ගිණුම් ලාභ බෙදීමේ මූලධර්මය මත පදනම් වී ඇත. අපේ ආයෝජන කලඹ තුළින් උපයන ලාභයෙන් කොටසක් ඔබේ ආයෝජනය වෙනුවෙන් පිරිනමන්නෙමු. ආයෝජන කලඹෙහි සාර්ථකත්වය මත ඔබේ ආයෝජනයේ ප්‍රතිලාභ ද ඉහළ යනු ඇත.

සමාජමය වශයෙන් හානිකර ව්‍යාපාර කටයුතු සඳහා ඔබේ ධනය යොදා නොගන්නා බවට සහතික වෙමින් අපි ඔබට හෘදය සාක්ෂියට එකඟව හා ගෞරවාන්විතව ප්‍රතිලාභ බුක්ති විඳීමට අවස්ථාව සලසන්නෙමු.

### ස්වභාවය

- සංකල්පය: මුදාරබා (ලාභ බෙදීම)
- කාල සීමා සහ ලාභ බෙදීමේ අනුපාත: (පාරිභෝගියා : බැංකුව)

  - මාස 03 - 60% : 40%
  - මාස 06 - 65% : 35%
  - මාස 12 - 75% : 25%
  - මාස 12 (ලාභ මාසිකව) - 70% : 30%
  - මාස 24 - 80% : 20%
  - මාස 36 - 85% : 15%
  - මාස 60 - 90% : 10%

- අවම ආයෝජනය: රු. 50,000 මාස 06, මාස 12, මාස 24, මාස 36, මාස 60 සඳහා (ලාභ කල්පිරීමේදී)
  රු. 100,000 මාස 12 සඳහා (ලාභ මාසිකව)

ප්‍රතිලාභ
- ආයෝජන සහතිකය
- ලාභ පැවරීමේ ස්ථාවර නියෝග පහසුකම්
- ආයෝජන කාලසීමාව අවසානයේදී ස්වයංක්‍රීය ප්‍රති ආයෝජන පහසුකම්

**අවශ්‍ය ලියකියවිලි**
තනි පුද්ගල : ජාතික හැඳුනුම්පත (NIC)/විදේශ ගමන් බලපත්‍රය/රියදුරු බලපත්‍රය (DL)
සමාගම්, සංගම් සහ සමිති : ලියාපදිංචි සහතිකය සහ අනිකුත් නීතිමය ලියකියවිලි

## අදහස් සහ පැමිණිලි

අමානා බැංකුව, පාරිභෝගික ඔබගේ අදහස් සහ යෝජනා අගය කොට සලකයි. එබැවින් ඔබගේ අදහස්, ශාඛාවේ ඇති **"ඔබ ලද සේවා අත්දැකීම පිළිබඳව අපට කියන්න"** පෝරමය පිරවීමෙන් හෝ එම පෝරමය අප වෙබ් අඩවියෙන් බාගත කොට පිරවීමෙන් අප වෙත යොමු කරන්න.
මීට අමතරව, අප සේවාව පිළිබඳ ඔබගේ අදහස් සහ පැමිණිලි ඔබට පහත ආකාරයන්ගෙන් අප වෙත යොමු කළ හැක.

- අදාළ ශාඛාවේ කළමණාකාර මහතා හමුවීමෙන්
- ඔබගේ පැමිණිලි feedback@amana.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කිරීමෙන්
- අපගේ ක්ෂණික ඇමතුම් අංක 011 7 756756 ඔස්සේ අප ඇමතීමෙන්
- අපගේ වෙබ් අඩවියේ ඇති, සම්බන්ධ වන්න පිටුවෙහි ඔබගේ පැමිණිලි සටහන් කිරීමෙන්

ඔබගේ පැමිණිල්ල ලද විගස එය ලැබූ බවට සනාථ කරමින්, ඒ පිළිබඳව ඉදිරියේදී ගනු ලබන පියවරයන් සම්බන්ධයෙන් අප ඔබව දැනුවත් කර සිටිමු.

## ගිණුම් හිමියන් සඳහා පොදු ව්‍යාපාරික කොන්දේසි

1. අමානා බැන්ක් ලිමිටඩ් ('බැංකුව') සමග ගිණුමක් විවෘත කිරීම මගින්, මීට පටහැනිව වෙනත් ආකාරයකට ලිඛිතව ප්‍රතිපාදන සළසා බැංකුව ඊට එකඟ වී නොමැති නම්, ගණුදෙනුකරු විසින් ඔහුව/ඇයව/ඔවුන්ව මෙම කොන්දේසි වලට යටත් කරයි.

2. ගණුදෙනුකරුගේ අත්සනෙහි ආදර්ශයක් සහ ගණුදෙනුකරු සහ බැංකුව බැඳීමට ලක්කරන වෙනත් පුද්ගලයන් ඇත්නම් එම පුද්ගලයන්ගේ ආදර්ශ අත්සන් බැංකුව වෙත සැපයීමට ද, එම බලය සාමාන්‍ය හෝ සීමාසහිත ද යන්න සහ සීමාසහිත නම්, එම සීමාකිරීමේ ප්‍රමාණය නිශ්චිතවම කොතෙක් ද යන්න සඳහන් කිරීමට ද ගණුදෙනුකරු බැඳී සිටියි. ආකෘති පත්‍ර වල කිසිදු සීමා කිරීමක් සඳහන් කර නොමැති නම්, එම තැනැත්තන්ගේ බලය සාංගමික ව්‍යවස්ථාවලිය මගින් හෝ, සංස්ථා වල රෙගුලාසි මගින් හෝ, සාමාන්‍ය හෝ සීමාසහිත ඇටෝර්නි බලපත්‍ර මගින් හෝ වෙනත් යම් ලේඛණයක් මගින් විශේෂයෙන් අර්ථදක්වා ඇති බව පෙනී ගිය ද, ආදර්ශකයක් සපයා ඇති ඕනෑම අත්සනක් මගින් ඕනෑම මුදල් ප්‍රමාණයකට සහ ඕනෑම අරමුණකට ගණුදෙනුකරු පූර්ණ වශයෙන් බැඳී සිටිනු ඇත. ගණුදෙනුකරු බැඳීමට ලක්කිරීමට හැකි තැනැත්තන් සම්බන්ධයෙන් හෝ ඔවුන්ගේ බලයෙහි ප්‍රමාණය සම්බන්ධයෙන් හෝ වෙනස්කම් සිදුකිරීම බැංකුව විසින් පිළිගනු ලබන්නේ ඉහත සඳහන් ආකෘතිපත්‍ර මගින් ඒ පිළිබඳ දැණුම්දීම කළහොත් පමණි. මෙම ලිපියෙහි සඳහන් කර ඇති ලෙස ආදර්ශක සැපයීමට අතපසු කිරීම නිසා හෝ, ඒවා වැරදි හෝ අසම්පූර්ණ ආකාරයට සැපයීම නිසා ගණුදෙනුකරු විසින් සිදුකරගන්නා හානි හෝ පාඩු සඳහා බැංකුවෙහි වගකීමක් නොමැත.

3. යම් ගිණුමක් පුද්ගලයන් දෙදෙනෙකුගේ හෝ වැඩි ගණනක හවුල් නම් වලින් පවත්වාගෙන ගියහොත්, වෙනත් ආකාරයකට ලිඛිතව එකඟ වී නොමැති නම්, එම ගිණුම සම්බන්ධයෙන් ඔවුන්ගෙන් එක් අයෙකු හෝ වැඩි ගණනක් විසින් සිදුකරන සියළු ක්‍රියා මගින් ගිණුම සඳහා ඔවුන් සියළු දෙනාම හවුලේ සහ වෙන්වෙන්ව වගකීමට බැඳී සිටිනු ඇත.

4. විශේෂ අරමුණක් සඳහා බැංකුව වෙත භාර දී ඇති සුරක්ෂිතයන් (මුදල් ලේඛණ නිශ්චිත බැඳුම්කර වලට හැරවීම්, පරීක්ෂා කිරීම, හුවමාරුකිරීම් හෝ ලාභාංශ එකතුකිරීම වැනි) හැරුණු විට, උදහරණ ලෙස සුරක්ෂිතයන්, නෞභාර බිල්පත්, බලපත්, විණිමය බිල්පත් හා වෙනත් වාණිජ ලේඛණ වැනි බැංකුව භාරයේ ඇති හෝ භාරයට පත්වනු ඇති හෝ තෙවන පාර්ශවයන් විසින් බැංකුව වෙනුවෙන් ගණුදෙනුකරුගේ අවදනම මත තබාගෙන සිටින ගණුදෙනුකරුට අයත් වන සියළුම වටිනාකම් ලේඛණ, තවමත් කල්පිරී නොමැති හෝ අනිශ්චිත ඒවා ද ඇතුළුව බැංකුව ට ගණුදෙනු කරුට එරෙහිව ඇති සියළුම අයැදීම් සඳහා බැංකුවට ඇපයට යටත්ව ඇති බවට සැළකෙනු ඇත. වෙනත් ආකාරයකට කටයුතු සළසා නොමැති නම්, ඉහත සඳහන් ඇපයට අඩංගු වන සුරක්ෂිතයන්, එම සුරක්ෂිතයන් නැවත ඇප තැබීමට අයිතිය ද සහිතව, බැංකුව විසින් එහි පොදු සුරක්ෂිත සේප්පුවට ගනු ඇත.

5. ගනුදෙනුකරු විසින් බැංකුව වෙත ඇති ඔහුගේ/ඇයගේ බැඳීම් කිසියම් හෝ ආකාරයකින් ඉටු නොකරන්නේ නම්, ක්‍රියාවේ යෙදවීමට එයට ඇති අයිතිය හැර සහ ඊට අමතරව, බැංකුවට කිසිදු පූර්ව දැණුම් දීමකින් තොරව හෝ කලින් සිතාසි නිකුත් කිරීමකින් තොරව එය විසින් සුදුසු යැයි සලකන වේලාවක සහ සුදුසු ආකාරයකට, සුරක්ෂිතය සම්පූර්ණයෙන් හෝ එයින් යම් කොටසක් මුදල් කරගැනීමට සහ, පියවීම සිදුකරන මොහොත තෙක් එම ආදයමෙන්, වියදම් ද ඇතුළුව බැංකුව වෙත අය විය යුතු සියළුම මුදල් සඳහා, තමන් වෙත ආපසු ගෙවාගැනීමට අවසර ඇත.

6. යම් විශේෂ සහ/හෝ පොදු ලියමක් (General lien) හෝ අයිතින් ක්‍රියාත්මක වීමෙන් හෝ වෙනත් ආකාරයකින් බැංකුවට හිමිකම පවතින වෙනත් අයිතීන්ට හෝ ප්‍රතිකර්ම වලට අමතරව, බැංකුව විසින් ඕනෑම අවස්ථාවක ගණුදෙනුකරු වෙත දැණුම් දීමකින් තොරව, ගණුදෙනුකරුගේ සහ අපගේ හෝ අපගෙන් එක් අයකුගේ හෝ වැඩි ගණනකගේ සියළු මුදල් හා වගකීම් සම්බන්ධ කිරීම සහ/හෝ ඒකාබද්ධ කර, ඉහතකී එම යම් ගිණුමක බැරට පවතින යම් මුදලක් වෙනත් යම් ගිණුමක හෝ වනත් යම් ආකාරයකට පවතින කිසියම් වගකීමක්, එම වගකීම යථා හෝ අනිශ්චිත වුවද, ප්‍රාථමික හෝ අතිරේක හෝ වුවද, වෙන්වෙන් හෝ හවුල් වුවද, තෘප්තිමත් කිරීම සඳහා පියවීම හෝ මාරුකිරීම සිදුකළ හැකිය.

7. බැංකුව විසින් බැර සටහන් ඇතුළත් කිරීම සිදුකරනු ලබන්නේ, එම ඇතුළත් කිරීම් වලට ප්‍රතිපක්ෂව බැංකුවට ප්‍රතිවටිනාකමක් ගණුදෙනුකරුගෙන් හෝ ගණුදෙනුකරු වෙනුවෙන් ලැබීමට ඇත්නම් එය නිසි කලට නිසි ආකාරයෙන් ලබාගනු ඇති අතර එය හිඟ ව තිබුණහොත්, කිසිදු ආකාරයක දැණුම් දීමකින් තොරව යම් බැර ඇතුළත් කිරීමක් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් ආපසු හැරවීමට බැංකුවට හිමිකම ඇතැයි යන කොන්දේසිය සහිතව ය.

8. ගිණුම් ප්‍රකාශනය සැලකිල්ලෙන් පරීක්ෂා කර බැලිය යුතු අතර, කිසියම් වරදක් හෝ අතපසු වීමක් සිදුව ඇත්නම් වහාම බැංකුව දැණුවත් කළ යුතුය. ප්‍රකාශනයෙහි දක්වෙන වැරදි එය ලැබීමෙන් දින හතක් ඇතුළත බැංකුවට ලිඛිතව පෙන්වා නොසිටියහොත් එම ප්‍රකාශනය ප්‍රශ්න කිරීමට ගණුදෙනුකරුට අයිතියක් නොමැති වනු ඇති අතර, එය ඉන් පසුව බැංකුව සහ ගණුදෙනුකරු අතර අවසානාත්මක සහ තීරණාත්මක වනු ඇත.

9. පහත දක්වෙන කොන්දේසි මගින් ගණුදෙනුකරු විසින් බැංකුවේ පවතින සිය ගිණුම සඳහා චෙක්පත් ලිවීම පාලනය වෙනු ඇත.

(අ) බැංකුව විසින් ගණුදෙනු කරු වෙත ලබා දී ඇති චෙක් පොත ගණුදෙනුකරු විසින් සුරක්ෂිතව තබාගත යුතු වන අතර, චෙක් පොත හෝ කිසියම් චෙක් පතක් නැතිවීමකදී හෝ සොරකම් කිරීමකදී ගණුදෙනුකරු විසින් බැංකුව දැණුවත් කළ යුතු අතර ඒ පිළිබඳව බැංකුව වෙත ලිඛිත තහවුරු කිරීමක් සැපයිය යුතුය. එවැනි දැන්වීමක් ලැබීමට පෙරාතුව බැංකුව විසින් නැතිවූ, නීතිවිරෝධී ලෙස භාවිතා කළ, වංචනික ලෙස වෙනස් කළ හෝ කූඨ ලෙස සැකසූ චෙක්පතකට ගෙවීමක් කර ඇත්නම් එසේ ගෙවන ලද මුදල ගණුදෙනුකරුගේ ගිණුමෙන් හර කිරීමට බැංකුවට හිමිකම පවතිනු ඇත.

(ආ) ගණුදෙනුකරු විසින් නිකුත් කරන ඕනෑම චෙක්පතක් හැකි තරම් දුරට වංචනික වෙනස්කිරීම් වැලැක්වෙන ආකාරයට ගණුදෙනුකරු විසින් පිරවිය යුතුය. එබැවින්, ඉක්මනින් හඳුනාගැනීමට නොහැකි වන පරිදි ඉලක්කම් හෝ වචන එකතු කිරීමක් සිදුකළ නොහැකි වන පරිදි, චෙක්පත භාවිතා කරන මුදල් ප්‍රමාණය ඉලක්කම් වලින් සහ අකුරෙන් ද ලිවිය යුතුය

(ඇ) ගණුදෙනුකරුට සිය චෙක් පොතෙන් තවදුරටත් ප්‍රයෝජනයක් නොවුවහොත් සහ ඔහුගේ ගිණුම වසා දැමුවහොත්, හැකි ඉක්මනින් ඔහුගේ චෙක්පොත ආපසු බැංකුව වෙත භාරදීමට ඔහු බැඳී සිටියි.

10. චෙක්පත් නැතිවුවහොත්/සොරකම් කළහොත් හෝ අස්ථාන ගතවුවහොත්, එම චෙක් අංකය, දිනය, මුදල හා ගෙවීම් ලබන්නාගේ නම සඳහන් කරමින්, ගෙවීම නතරකිරීමට ගනුදෙනුකරු විසින් හැකි ඉක්මනින් බැංකුව ට උපදෙස් දිය යුතුය. එම උපදෙස් ක්‍රියාවෙහි යෙදවෙන්නේ එම උපදෙස් ලැබෙන මොහොත වන විට අදාල චෙක්පත/පත් සඳහා ගෙවීම් කර නොමැති නම් පමණි. දුරකථනයෙන් ලබාදෙන ගෙවීම් නතරකිරීමේ උපදෙස් අදාල දුරකථන ඇමතුමෙන් පසු පැය 48ක් ඇතුළත ලිඛිතව තහවුරු කළ යුතුය. පැය 48ක් තුළ එසේ ලිඛිත උපදෙස් නොලැබුණහොත් අදාල ගෙවීම් නතරකිරීමේ උපදෙස් අවලංගු කිරීමට බැංකුවට අයිතිය ඇත.

11. බැංකුව විසින් සියළු බැංකු ගාස්තු, සියළුම ආකාරයේ වියදම්, අයකිරීම්, කොමිස් මුදල්, දඩ මුදල්, ලාභ ගැලපීම්, අයෝජන වල ආදයම්, නීති හා, ඉහත කී ඒවාට අදාල වන හෝ ආනුෂංගික වන, බදු අය කෙරෙන හෝ නොකෙරෙන ඉහත කී ආකාරයේ බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලට අනුකූලව කලින් කලට බැංකුව විසින් අයකෙරෙන වෙනත් ගාස්තු සහ, බැංකුව මත පනවනු ලබන බදු සහ/හෝ ගාස්තු හෝ අයබදු වැනි බැංකුවට දරන්නට සිදුවෙන වෙනත් යම් මුදල් ප්‍රමාණයන් ගණුදෙනුකරුගේ ගිණුම් වලින් හර කරනු ඇත. මීට අමතරව තැපැල්, මුද්දර ගාස්තු, දුරකථන සහ SWIFT ගාස්තු වැනි බැංකුවට සිදුවන සියළුම වියදම් ගණුදෙනුකරුගෙන් අයකරගනු ඇත.

12. බැංකුව විසින් එහි තනි සහ නිදහස් අභිමතය පරිදි ඕනෑම අවස්ථාවකදී කිසිදු හේතුවක් නොදක්වා ගිණුමක් වසා දමනු ඇත. කෙසේ වුවද, ගිණුම වසා දමන බවට බැංකුව විසින් ගණුදෙනුකරුට දින 30ක දැණුම් දීමක් ලබාදෙනු ඇත. එකී දැන්වීම ගණුදෙනුකරුගේ අවසානයට දන්නා ලිපිනයට තැපැලෙන් යවනු ලැබුවහොත් එය ප්‍රමාණවත් පරිදි ගණුදෙනුකරු වෙත භාර දී ඇතැයි සැලකෙනු ඇත. ඉල්ලා සිටි විට ගණුදෙනුකරුගේ සන්තකයේ ඇති සියළුම භාවිතා නොකළ චෙක්පත් ගණුදෙනු කරු විසින් ආපසු භාරදිය යුතුය.

13. බැංකුව වෙත ලබාදී ඇති සියළුම තොරතුරු (ගිණුම් විවෘත කිරීමේ ආකෘතිපත්‍රයක හෝ වෙනත් ආකාරයකට) ගණුදෙනුකරුගේ උපරිම දැණුමට අනුව සත්‍ය සහ නිවැරදි බවට ගනුදෙනු කරු සහතික කරයි. මෙම තොරතුරු වල යම් වෙනසක් සිදුවුවහොත් බැංකුව වෙත දැණුම් දීමට ගණුදෙනුකරු වගකීම භාරගනියි.

14. ගණුදෙනුකරුගේ ලිපිනයේ යම් වෙනසක් සිදුවූ වහාම බැංකුව වෙත දැණුම් දිය යුතුය.

15. බැංකුවේ තැන්පත් කරන සෑම තැන්පතුවක්ම එහි කවුන්ටර වලදී ගෙවිය යුතු වේ.

16. අමානා බැංකු ජංගම ගිණුම් ක්වාර්ඩ් (ණය) මූලධර්ම වලට අනුකූලව මෙහෙයවෙනු ඇත. බැංකුව සමඟ විශේෂ සූදනම් කරගැනීමකින් හැර, ගණුදෙනු කරු සිය ගිණුම/ගිණුම් ඉක්මවා මුදල් නොගත යුතුය. ගිණුම් වල ප්‍රමාණවත් තරම් අරමුදල් නොමැති නම් චෙක්පත් අගරු කිරීමට ද, අගරු වන සෑම චෙක්පතක් සඳහාම ගාස්තු අයකිරීමට ද බැංකුවට අයිතිය පවතී. කෙසේ වුවද, බැංකුව විසින් එහි තනි අභිමතය පරිදි, ගණුදෙනුකරුගේ අවසරලත් අත්සන්කරුවෙකු විසින් පිළිගත් හෝ ලියූ චෙක්පත/පත් සහ/හෝ බිල්පත් සහ/හෝ පොරොන්දු නෝට්ටු වලට ගෙවීම, එම චෙක්පත් ආදයට ගෙවීම මගින් එකී ගිණුම සීමාව ඉක්මවා යාම හෝ අයිරා සැකසුමක් ඉක්මවා යාම නොසළකා, කළ හැකිය. එවැනි අවස්ථා වලදී, බැංකුවේ ගාස්තු, සියළුම ආකාරයේ වියදම්, අයකිරීම්, කොමිස් මුදල්, දඩ මුදල්, ලාභ ගැලපීම්, අයෝජන වල ආදයම්, නීති හා, ඉහත කී ඒවාට අදල වන හෝ ආනුෂංගික වන, බදු අය කෙරෙන හෝ නොකෙරෙන ඉහත කී ආකාරයේ බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලට අනුකූලව කලින් කලට බැංකුව විසින් අයකෙරෙන වෙනත් ගාස්තු සහ බැංකුව මත පනවනු ලබන බදු සහ/හෝ ගාස්තු හෝ අයබදු වැනි බැංකුවට දරන්නට සිදුවෙන වෙනත් යම් මුදල් ප්‍රමාණයන් ද සමඟ එසේ ඉක්මවාගිය මුදල ඉල්ලා සිටි විටෙක කොන්දේසි විරහිතව ආපසු ගෙවීමට ගණුදෙනුකරු බැඳී සිටින අතර, ඉහත කී ආකාරයේ පිරිවැය හා ගාස්තු ගණුදෙනුකරුගෙන් අයකරගැනීමට බැංකුවට අයිතිය පවතී. මෙහි අඩංගු කිසිවක් බැංකුව විසින් කිසියම් ආකාරයක හෝ අයිරා පහසුකමක් ලබාදීමට බැඳී ඇති බවට බැංකුව විසින් ප්‍රකාශිත හෝ අනුමිත හෝ ගිවිසුමක් ලෙස අර්ථනිරූපනය නොකළ යුතුය.

17. ජංගම ගිණුම සම්බන්ධයෙන් යම් අයිරා හෝ වෙනත් යම් බැංකු පහසුකමක් පවතින අතර ඉහත කී ගිණුම් වලට බැර කෙරෙන කිසියම් හෝ සියළුම මුදල්, බැංකු ගාස්තු, ලාභ ගැලපීම් සහ සියළු ආකාරයේ වියදම්, බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලට අනුකූලව කලින් කලට බැංකුව විසින් එකී අයිරා හෝ වෙනත් යම් බැංකු පහසුමක් මත නියම කෙරෙන හෝ අයකෙරෙන සියල්ල, එකී ගාස්තු සම්පූර්ණයෙන් ගෙවෙන තෙක් අඩුකරගැනීමට පළමුව යෙදවෙනු ඇත. එසේ බැර කළ යම් මුදලක් එවැනි අයිරා හෝ වෙනත් යම් බැංකු පහසුකමක මූලික මුදල අඩු කරගැනීමට යෙදවෙනු ඇත්තේ ඉන් පසුව පමණි.

18. නොගෙවා පවතින යම් මුදලක් හෝ මුදල් හිඟව පවතින විට සහ ගණුදෙනුකරු විසින් ගෙවිය යුතු වන විට, සාමාන්‍ය බැංකු භාවිතයන්ට අනුව දඩ මුදල් අයකිරීමට බැංකුවට හිමිකම පවතිනු ඇත. එවැනි අවස්ථාවකදී එම දඩ මුදල් වල අගය බැංකුව විසින් පවත්වාගෙන යන පුන්‍ය අරමුදලට සෘජුව ම බැර කෙරෙනු ඇති අතර, බැංකුව විසින් එයින් සිය වියදම් පියවාගෙන එහි ශේෂය ශාරියා අධීක්ෂණ කවුන්සිලය විසින් අනුමත කරන ලද පුන්‍ය ආයතනයකට ලබාදෙනු ඇත.

19. චෙක් තැන්පතු පෙට්ටි සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර විසින් නිකුත් කරන තාවකාලික උපදෙස් පත්‍රිකාව නොසළකා, චෙක් තැන්පතු පෙට්ටි හෝ ටෙලර් යන්ත්‍ර වල තැන්පත් කරන ලදැයි පැවසෙන චෙක්පත් සම්බන්ධයෙන් සිදුකරන කිසිදු අයැදීමක්, එසේ තැන්පත් කළ චෙක්පත් ගණුදෙනුකරුගේ ගිණුමට බැරකර ඇත්නම් හැර, කිසිදු තත්වයක් යටතේ හෝ කුමන හේතුවක් නිසා හෝ බැංකුව භාර නොගනු ඇත. ගණුදෙනුකරුගේ ගිණුමට බැර කළ චෙක්පත් බාරගනු ලබන්නේ එකතු කිරීම සඳහා පමණක් වන අතර, චෙක්පත ලියන ලද බැංව මගින් නිෂ්කාශනය කරන තෙක් අයවීම් ආපසු ගැනීමට නොහැකිවනු ඇත. අරමුදල් ලබාගැනීමට හැකි දිනය දක්වනු ලබන්නේ දර්ශකයක් ලෙස පමණි.

20. බැංකුව විසින් භාර පිළි නොගනියි.

21. ගණුදෙනුකරුගේ ගිණුම් සම්බන්ධයෙන් වෙනත් බැංකු වලින් කෙරෙන විමසීම් වලට ගණුදෙනුකරුගෙන් කිසිදු වැඩිදුර විමසීමක් නොකර, ප්‍රතිචාර දැක්වීමට මෙමගින් ගණුදෙනුකරු විසින් බැංකුවට අවසර දෙයි.

22. බැංකුව විසින් නිෂ්පාදන හා සේවාවන් ඉස්ලාමීය බැංකු මූලධර්ම යටතේ පිරිනමන බව ගණුදෙනුකරු පිළිගෙන භාරගනියි. ඒ අනුව, බැංකුව සමඟ ගිණුමක් විවෘත කිරීම මගින් ගණුදෙනුකරු කලින් කලට බලපවත්වනු ලබන එකී බැංකු මූලධර්ම වලට යටත් වනු ඇත. ගණුදෙනුකරු විසින් එකී නිෂ්පාදන හා සේවාවන් ලබාගැනීමට අදල නීතිරීති සහ කොන්දේසි වල ශාරියා ලක්ෂණය බැංකුවේ ශාරියා අධීක්ෂණ කවුන්සිලයේ මගපෙන්වීම් සහ තීරණ වලට යටත් වනු ඇත.

23. බැංකුවේ ශාරියා අධීක්ෂණ කවුන්සිලයේ මගපෙන්වීම යටතේ ශාරියා නීතියට අනුකූලව ක්‍රියාකරන අතරම, බැංකු වලට අදල වන ශ්‍රී ලංකාවේ සියළුම සාමාන්‍ය නීති සහ රෙගුලාසි (ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන රෙගුලාසි සහ නියමයන් ද ඇතුළුව) මගින් බැංකුව පාලනය වේ.

24. බැංකුව විසින් යම් නිෂ්පාදනයක් හෝ සේවාවක් ලබාදීමට අදල වන නීතිරීති සහ කොන්දේසි වල ශාරියා ලක්ෂණ සම්බන්ධයෙන් ඇතිවන කිසියම් මතභේදයකදී, බැංකුවේ ශාරියා අධීක්ෂණ කවුන්සිලයේ තීරණ අවසානාත්මක වේ.

25. බැංකුවේ හුදු අභිමතය පරිදි මෙම නීතිරීති සහ කොන්දේසි කලින් කලට සංශෝධනය කිරීම, එකතු කිරීම හෝ ආදේශ කිරීම සිදුවනු ඇති අතර, එවැනි යම් සංශෝධනයක්, එකතු කිරීමක් හෝ ආදේශ කිරීමක් පිළිබඳව බැංකුව විසින් ගණුදෙනුකරු වෙත දැණුම් දෙනු ඇත. එසේ සංශෝධිත, එකතුකළ හෝ ආදේශ කළ නීතිරීති සහ කොන්දේසි බැංකුවේ ප්‍රධාන ශාඛාවේ බංකු ශාලාවේ සහ ශාඛා කාර්යාල වල ප්‍රදර්ශනය කිරීම, එවැනි යම් සංශෝධනයක්, එකතු කිරීමක් හෝ ආදේශ කිරීමක් පිළිබඳව ප්‍රමාණවත් දැණුම්දීමක් ලෙස සැලකෙනු ඇත.

26. මෙම නීතිරීති සහ කොන්දේසි වල යම් සංශෝධනයක්, එකතු කිරීමක් හෝ ආදේශ කිරීමක් පිළිබඳව දැන්වීමේ දින සිට සති දෙකක් ඇතුළත ගණුදෙනුකරු විසින් ගණුදෙනුකරුගේ විරෝධතා දැණුම් දී නොතිබුණහොත්, එවැනි දැණුම්දීමකට පසුව බැංකුවේ ගිණුම හෝ ගිණුම් අඛණ්ඩව පවත්වාගෙන යාම මගින් බැංකුව විසින් ඉහත කී කොන්දේසි වලට සිදුකළ එවැනි යම් සංශෝධනයක්, එකතු කිරීමක් හෝ ආදේශ කිරීමක් පිළිබඳව ගනුදෙනුකරු එකඟ වූ බවට සැලකෙනු ඇත.

ඉහත සඳහන් කළ පොදු ව්‍යාපාරික කොන්දේසි සඳහා මම/අපි එකඟ වන්නෙමි/මු.

| | |
|---|---|
| ............................................................................. | ............................................................................................... |
| ගිණුම්හිමිගේ අත්සන | ගිණුම්හිමිගේ නම |
| ............................................................................. | ............................................................................................... |
| ගිණුම්හිමිගේ අත්සන | ගිණුම්හිමිගේ නම |
| ............................................................................. | ............................................................................................... |
| ගිණුම්හිමිගේ අත්සන | ගිණුම්හිමිගේ නම |
| ගිණුම් අංකය : | දිනය : |

# මුදාරබා ගිවිසුම

## කාල ආයෝජන ගිණුම

මෙම මුදාරබා ආයෝජන ගිවිසුම වර්ෂ 20..... ක් වූ ............... මස ........ දින මින් මතුවට 'ආයෝජක/යන්' ලෙස හඳුන්වන ............................................................. ලිපිනයේ පදිංචි ............................................................................................................ යන අය (සන්දර්භය මගින් ඒත්තු යන ආකාරයට එම යෙදුම මගින් එකී ...................................................... සහ ඔහුගේ /ඇයගේ/ ඔවුන්ගේ උරුමකරුවන් පොල්මෘකරුවන් අද්මිනිස්ත්‍රාසිකරුවන් අනුප්‍රාප්තිකයින් හා පැවරුම්ලාභීන් අදහස් වන අතර ඇතුළත් වේ) එක් පාර්ශවයකට ද,

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නිසි ලෙස සංස්ථාපනය කර ඇති සමාගමක් වන සහ කොළඹ 03, ගාලු පාරේ අංක 480 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති (මින් මතුවට සමහර අවස්ථාවල 'මුදරිබ්' හෝ 'බැංකුව' යනුවෙන් හැඳින්වේ) සීමාසහිත අමානා බැංකුව (සන්දර්භය මගින් ඒත්තු යන ආකාරයට එම යෙදුම මගින් සීමාසහිත අමානා බැංකුව සහ එහි අනුප්‍රාප්තිකයින් සහ පැවරුම්ලාභීන් අදහස් වන අතර, ඇතුළත් වේ) අනෙක් පාර්ශවයට ද බැඳී ඇතිකරගන්නා ලදී.

ලාභයක් ජනනය කරනු ඇතැයි අපේක්ෂිත බැංකුවේ ව්‍යාපාර කටයුතුවල ආයෝජනය කිරීමට ආයෝජක/යන් කලින් කලට බැංකුවේ මුදාරබා අරමුදලෙහි ආයෝජනය කිරීමේ අරමුණ සඳහා බැංකුව සමඟ කාල ආයෝජන ගිණුමක් ඇරඹීමට කැමැත්තෙන් පසුවන බැවින් ද,

ලාභයක් ජනනය කරනු ඇතැයි අපේක්ෂිත බැංකුවේ ව්‍යාපාර කටයුතුවල ආයෝජනය සඳහා එම මුදල් ආයෝජනය සඳහා භාරගැනීමට ද, පහත දැක්වෙන නීතිරීති හා කොන්දේසි මත එකී ලාභ බෙදාගැනීමට බැංකුව කැමැත්තෙන් පසුවන බැවින් ද,

එබැවින් දැන් මෙම ගිවිසුම මගින් මෙහි පාර්ශවකරුවන් විසින් සහ ඔවුන් අතර පහත පරිදි එකඟ වී සිටියි.

**1. සන්දර්භය විසින් වෙනත් අයුරකින් අදහස් නොකෙරෙන්නේ නම්, මෙම ගිවිසුමෙහි,**

'ආයෝජනය' යන්නෙන් අදහස් වන්නේ, ආයෝජකයා සහ බැංකුව අතර එකඟ වූ ලාභය බෙදාගැනීමේ පදනමක් මත ආයෝජකයා විසින් බැංකුව වෙත භාරදෙන ලද මුදල හෝ මුදල් ය.

'මුදාරබා අරමුදල' යනුවෙන් අදහස් වන්නේ බැංකුව විසින් කළමනාකරණය කරන, බැංකුවේ ගනුදෙනුකරුවන් විසින් ශාරිආ නීතියට අනුකූල ව්‍යාපාර කටයුතුවල ආයෝජනය කිරීම සඳහා භාරදෙන ලද මුදල් සංචිතය ය.

'ලාභය' යන්නෙන් අදහස් වන්නේ මුදාරබා අරමුදල මගින් සිදුකරන ආයෝජන මත එකතු වූ, නියමිත කාලසීමාව අවසානයේ (මාසික/කාර්තුමය/ද්වි-වාර්ෂික ලෙස) අරමුදලේ ආයෝජකයින් හා බැංකුව අතර බෙදාහැරීම සඳහා ඇති අතිරික්තයයි.

'පාඩුව' යන්නෙන් අදහස් වන්නේ මුදාරබා අරමුදල මගින් සිදුකළ ආයෝජනයන් මගින් නියමිත කාලසීමාව අවසානයේ (මාසික/කාර්තුමය/ද්වි-වාර්ෂික ලෙස) ඇතිවූ, අරමුදලේ ආයෝජකයින් විසින් දැරිය යුතු වන ඌනතාවයයි.

**2. ලාභ සහ පාඩු**

අරමුදල මගින් ලබන ලද යම් ලාභයක්, එකඟ වූ ලාභ බෙදාගැනීමේ අනුපාතයට අනුකූලව බෙදාහැරෙනු ඇත.

පාඩු සිදුවන අවස්ථාවකදී ආයෝජකයා විසින් ආයෝජකයා අරමුදලට යෙදවූ ප්‍රාග්ධනය නොඉක්මවන උපරිම වටිනාකමක් දක්වා පාඩුව, ආයෝජකයා දැරිය යුතුය.

පාඩු ලබන කටයුතු සම්බන්ධයෙන් අරමුදලේ කළමනාකරු ලෙස බැංකුවට කිසිදු ආදායමකට හිමිකමක් නොලැබෙනු ඇත.

**3. කාල ආයෝජන සහතික නිකුත් කිරීම**

සෑම ආයෝජකයෙකුට ම කාල ආයෝජන සහතිකයක් නිකුත් කෙරෙනු ඇති අතර, එය ඔහුගේ බැංකුව සමඟ කළ ආයෝජනය සම්බන්ධව මූලික සාක්ෂිය වනු ඇත. එම සහතිකයේ පහත කරුණු දැක්වෙනු ඇත.

(අ) ආයෝජකයාගේ නම | (ඇ) ලාභ බෙදාගැනීමේ අනුපාතය

(ආ) ආයෝජනයේ ප්‍රාග්ධන මුදල | (ඈ) වලංගු කාලසීමාව

**4. ලාභය නිශ්චය කිරීම**

ආයෝජනයක් මත යම් නිශ්චිත අනුපාතයක් බැංකුව විසින් සහතික කළ නොහැකි බවත්, එසේ නොකරන බවත්, ලාභ බෙදාහරින අවස්ථාවේ දී කලින් එකඟ වී ඇති සහ එම ආයෝජනයට අදාල වන ලාභ බෙදාගැනීමේ අනුපාතය මත පදනම්ව මුදාරබා අරමුදල විසින් ලබන ලද සැබෑ ලාභය බෙදාගැනීමට පමණක් එකඟ වන බවත්, ආයෝජක/යන් සහ බැංකුව අතර පැහැදිළිව අවබෝධ කරගෙන එකඟ වී සිටියි. කලින් කලට පිරිනමන ලාභ බෙදාගැනීමේ අනුපාත බැංකුව විසින් ප්‍රකාශයට පත්කරනු ඇත.

එකඟ වූ ලාභ බෙදාගැනීමේ අනුපාතයක් මත යම් නිශ්චිත කාලසීමාවකට ආයෝජනයක් සිදුකළ පසුව එම කාලසීමාව තුළ එම ලාභ බෙදාගැනීමේ අනුපාතය වෙනස් කිරීමට බැංකුවට හිමිකමක් නොලැබේ. කෙසේ වුවද, යම් නැවත ආයෝජනය කිරීමක් එම කාප ආයෝජන ගිණුම කල්පිරෙන කාලයේ පවතින ලාභ බෙදාගැනීමේ අනුපාතය මත සිදුකෙරෙනු ඇත.

කල්පිරීමේ දිනයට පෙරාතුව නැවත ආයෝජනය කිරීම හෝ අරමුදල් ආපසු ගැනීම සම්බන්ධයෙන් බැංකුව වෙත නිශ්චිත උපදෙස් නොලැබුණහොත්, එම කාල ආයෝජන ගිණුම කල්පිරෙන කාලයේ පවතින නීතිරීති සහ කොන්දේසි මත එය නැවත ආයෝජනය කිරීමට මුදරිබ් වෙත මෙමගින් අවසර ලැබේ.

ආයෝජනය මත ලැබෙන ලාභය දිනපතා ගණනය කර මාසිකව/කාර්තුමය/ද්වි-වාර්ෂිකව හෝ කලින් කලට බැංකුව විසින් තීරණය කරන පරිදි බෙදාහැරෙනු ඇත.

**5. කල්පිරීමට පෙර ආපසු ගැනීම්**

කාල ආයෝජන ගිණුමෙහි ආයෝජනය කළ මුදල් කල්පිරීමට පෙර ආපසුගැනීම සිදුකළ හැක්කේ බැංකුවේ තනි අභිමතය පරිදි පමණකි. කල්පිරීමට පෙර ආපසු ගැනීමකදී ලාභය රඳවාගැනීමට හෝ සිය අභිමතය පරිදි ලාභ බෙදාගැනීමේ අනුපාතය සාමාන්‍ය ඉතිරිකිරීමේ ගිණුමකට අදල ලාභ බෙදාගැනීමේ අනුපාතය දක්වා වෙනස් කිරීමට බැංකුවට හිමිකම පවතී

**6. වියදම්**

මුදාරබා අරමුදල පරිපාලනය කිරීම හා සෘජුවම සම්බන්ධ වියදම් එම අරමුදලෙන් අයකරගැනීමට බැංකුවට බලය ඇත.

**7. අත්හිටුවීම්**

ආයෝජකයාගේ සිහිවිකල්වීම, වස්තුභංගත්වය, බංකොලොත්භාවය හෝ මරණය සම්බන්ධයෙන් වලංගු දැනුම්දීමක් මත, ගිණුමේ ආයෝජනවල ආදායම් බෙදාහැරීමේ සැකසුම් නිශ්චිතව දක්වමින් බැංකුව වෙත අධිකරණ නියෝගයක් නිකුත් කරන තෙක් තවදුරටත් ආපසු ගැනීමේ අයිතියක් රහිත වන පරිදි, සියලු ගණුදෙනු අත්හිටුවා, එම දැනුම්දීම ලැබුණු දිනයට මුදාරබා අරමුදලේ ආයොජක/යන්ගේ ගිණුම්වල බැරට පවතින සියලුම මුදල්, බැංකුව විසින් රඳවාගනු ඇත.

**8. බද්ධ ගිණුම් හිමියන්**

පුද්ගලයන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු ඒකාබද්ධව ගිණුමක් දරන යම් බද්ධ ගිණුම් හිමියෙකුගේ මරණය සිදුවූ විට, ලියමක් පවත්වාගැනීමට සහ ඕනෑම ස්වභාවයක පියවාගැනීමක් කිරීමට බැංකුවට ඇති අයිතියට සහ මුදාරබා ආයෝජන පාලනය වන බැංකුවේ නීතිරීතිවල හෝ ඊට සම්බන්ධ කලින් කලට අදල වන වෙනත් නීති හා රෙගුලාසිවල ප්‍රතිපාදනවලට අනුකූලව ක්‍රියා කිරීම සඳහා පියවර ගැනීමට ඇති අයිතියට අගතියකින් තොරව, ආයෝජනය කළ මුදල අනෙක් පාර්ශවයන් වන ජීවත් තැනැත්තාගේ/තැනැත්තන්ගෙ නමට දරා සිටීමට බැංකුවට අයිතිය පවතිනු ඇත. ගිණුම් හිමියන්ගෙන් එක් අයෙකු මියගිය විට වහාම ඒ බව බැංකුව වෙත දැන්වීමට අනෙක් පාර්ශවයන් ජීවත් වන තැනැත්තා/තැනැත්තන් මෙමගින් භාරගනියි.

**9. ප්‍රතිපාදන**

මුදාරබා අරමුදලෙහි කළමනාකරු ලෙස බැංකුවට සිය අත්දැකීම්, දැනුම හා විශේෂඥභාවය භාවිතා කර, ලාභ වලින් වෙනත් ගාස්තු අයකරගැනීමට පෙර, ලාභ බෙදාහරින අවස්ථාවේදී අක්‍රිය මුදාරබා, මුෂරාකා හෝ ඊට සමාන මුල්‍ය පහසුකම් වලින් පැනනැගිය හැකි පාඩුවලට මුහුණ දීමට අවශ්‍ය විය හැකි තක්සේරු කළ පාඩු පියවීම සඳහා මුදාරබා අරමුදලේ ලාභ වලින් මුදල් අයකරගැනීමට අවසර ලැබේ. මුදාරබා අරමුදල ඇවර කිරීමේදී ප්‍රතිපාදනවල ඇති අතිරික්තයක් හෝ ඌනතාවයක් එම කාලයේදී මුදාරබා අරමුදලට සහභාගී වන්නන් විසින් ලබාගැනීමට හෝ දරාගැනීමට සිදුවේ.

<u>ලාභ බෙදාගැනීමේ අනුපාතය</u>

අමානා බැංකුව ☐☐ %

ගණුදෙනුකරු ☐☐ %

ආයෝජකගේ අත්සන

අමානා බැංකුව වෙනුවෙන් අත්සන් කරන ලදී

| සාක්ෂිකරුවන් | අත්සන | නම | දිනය |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |